00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU5550 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.01.28 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. අධ්‍යාපන මනෝවිද්‍යාව යනු කුමක් ද? නිර්වචනයක් මගින් පැහැදිලි කරන්න.

02. අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම භාවිත කරන ගුරුවරයාව හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) සාකච්ඡා කරන්න.

03. ඔබ ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ශිෂ්‍ය අවධානය රඳවා තබා ගැනීම සඳහා යොදන උපාය මාර්ග පහක් (05) ලියන්න.

04. 'සමස්ථ සංවර්ධනය' යන සංකල්පය අර්ථ දක්වන්න.

05. සිසුන් අධ්‍යයනය කිරීමේ දී සෘජු නිරීක්ෂණයේ (Direct Observation) වාසි දෙකක් හා වක්‍ර නිරීක්ෂණයේ (Indirect Observation) වාසි දෙකක් බැගින් ලියන්න.

06. ඵලදායී ඉගෙනුමක් සඳහා පෙළඹීම ඉතා වැදගත් වේ. මාස්ලෝගේ අවශ්‍යතා අනුපිළිවෙල පිළිබඳ න්‍යායයේ සඳහන් පෙළඹීම පිළිබඳ මුල් පියවර පහ (05) පිළිවෙලින් ලියන්න.

07. ප්‍රජානන සංවර්ධනය හා සම්බන්ධ සංරක්ෂණ හැකියාව උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

08. අහිතකර චිත්තවේග ප්‍රදර්ශනය කරන ප්‍රාථමික පාසල් දරුවකු සම්බන්ධයෙන් ගුරුවරයා ගතයුතු ක්‍රියාමාර්ග පහක් (05) යෝජනා කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) අධ්‍යාපන මනෝවිද්‍යාව හා සම්බන්ධතා පවතින මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍ර පහක් (05) ලියන්න. (ලකුණු 05)

(ii) අධ්‍යාපන මනෝවිද්‍යාව මගින් සංවර්ධනය කෙරෙන ගුරු භූමිකාව පහත සඳහන් කාර්ය තුන යටතේ විග්‍රහ කරන්න.

- ඉගෙනුම් අපේක්ෂණ අර්ථ දැක්වීමේ කාර්යය
- ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ කාර්යය
- ඉගෙනීම් ප්‍රතිඵල ඇගැයීමේ කාර්යය (ලකුණු 15)

10. (i) ළමා චර්යා අධ්‍යයන පිළිබඳ පර්යේෂණාත්මක හා පර්යේෂණාත්මක නොවන ක්‍රම සංසන්දනාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? ඔබ කරනු ලබන ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක දී දරුවෙකු පිළිබඳ තොරතුරු රැස් කර ගැනීමට උචිත සැලසුමක් පිළියෙළ කරන්න. (ලකුණු 10)

11. (i) පියාජේ (Piajet) හා විගොට්ස්කි (Vigotsky) ඉදිරිපත් කළ න්‍යායන් දෙකෙහි ප්‍රධාන මූලධර්ම උදාහරණ ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) විගොට්ස්කිගේ න්‍යායට අනුව සුසාධ්‍යකාරකයකු වශයෙන් ගුරුවරයාගේ භූමිකාව උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ගෙස්ටෝල්ට් න්‍යායේ (Gestalt Theory) ප්‍රධාන මූලධර්ම උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

(ii) ගෙස්ටෝල්ට් න්‍යායට (Gestalt Theory) අනුව ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) **මතක තබා ගැනීම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් ඔබ යොදා ගන්නා උපායමාර්ග තුනක් (03) සාකච්ඡා කරන්න.** (ලකුණු 10)

(ii) ඉගෙනුම් මාරුව යන්න පැහැදිලි කර ඉගෙනුම් මාරුවක් හෙවත් පුහුණු මාරුවක් ඇතිවන පරිදි ඉගැන්වීමේ වැදගත්කම උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.